# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2059/55 - 2018 පෙබරවාරි මස 23 වැනි සිකුරාදා - 2018.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### වන සංරක්ෂණ ආඥාපනත

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත (451 වැනි අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ වූ නියමය.

නියමය

1966 අංක 13, 1979 අංක 56, 1982 අංක 13, 1988 අංක 84, 1995 අංක 23 හා 2009 අංක 65 දරන පනත්වලින් සංශෝධිත (451 වැනි අධිකාරය) වූ වන සංරක්ෂණ ආඥාපනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය, මෛත්‍රීපාල සිරිසේන වන මම, පහත අංක 01, 02, 03, 04 හා 05 උපලේඛනවල සහ එහි මායිම් තුළ පිහිටි හෙක්ටයාර් 13.0867 ක විශාලත්වයෙන් යුතු නකල්ස් වන රක්ෂිතයට යාබද ලැලි අඹේ, කොළ ඇල, හේවුඩ්, හල්ගොල්ල, පුහුඅරඹ වනාන්තරය වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 15 වැනි දින සිට ලැලි අඹේ, කොළ ඇල, හේවුඩ්, හල්ගොල්ල, පුහුඅරඹ රක්ෂිත වනාන්තරය ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,<br>
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍ය.

2018 පෙබරවාරි මස 15 වැනි දින,<br>
බත්තරමුල්ල,<br>
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ දී ය.

උපලේඛනය 01

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ, උඩන්ගොමුව ගමේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මූලික පිඹුර මා 1412 හි කැබලි අංක 1, 2 හා 3 ලෙස හඳුන්වන ලැලි අඹේ කැළය නැමති ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.6763 ක් වූ විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : මූලික පිඹුර 3951 හි කැබලි අංක 10712, ප්‍රධාන මාර්ගයේ සිට හපුවිද දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය සහ මූලික පිඹුර 3951 හි කැබලි අංක 10712 ;

*නැගෙනහිරට* : මූලික පිඹුර 3951 හි කැබලි අංක 10712, 10713, කපන ලද කාණුව, මූලික පිඹුර 3951 හි කැබලි අංක 10713 සහ මාතලේ සිට ඇල්කඩුව දක්වා වූ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය ;

*දකුණට* : මූලික පිඹුර 3951 හි කැබලි අංක 10713, කපන ලද කාණුව, මූලික පිඹුර 3951 හි කැබලි අංක 10713, ප්‍රධාන මාර්ගයේ සිට හපුවිද දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය, මූලික පිඹුර 3951 හි කැබලි අංක 10713 ;

*බටහිරට* : මූලික පිඹුර 3951 හි කැබලි අංක 10712.

*ප්‍රමාණය* : හෙක්. 0.6763

**උපලේඛනය 02**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඹුල්පිටිය ගමේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මූලික පිඹුර මා 1413 හි කැබලි අංක 1, 2, 3 හා 4 ලෙස හඳුන්වන හේවුඩ් එස්ටේට් නමැති ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.8676 ක් වූ විශාලත්වයෙන් යුත් රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : මූලික පිඹුර මා 715 හි කැබලි අංක 17, 18, 20, 21, 27 (ප්‍රධාන මාර්ගයේ සිට නිවාස දක්වා වූ මාර්ගය) 26, 4, 28 සහ 30 ;

*නැගෙනහිරට* : හිමිකම් පිඹුර 46680, මූලික පිඹුර මා 715 හි කැබලි අංක 31, 39, 40, 41, 47 සහ කොළ ඇළ ;

*දකුණට* : මූලික පිඹුර මා 715 හි කැබලි අක 46, 42, 38, 32, 49, 32, 33, 28, ප්‍රධාන මාර්ගයේ සිට නිවාස දක්වා වූ මාර්ගය සහ කොළ ඇළ ;

*බටහිරට* : කොළ ඇළ සහ වත්තේගම සිට ඇල්කඩුව දක්වා වූ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය හා මූලික පිඹුර මා 715 හි කැබලි අංක 6.

*ප්‍රමාණය* : හෙක්. 0.8676.

**උපලේඛනය 03**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඹුල්පිටිය ගමේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මූලික පිඹුර මා 1413 හි කැබලි අංක 5, 6 හා 7 ලෙස හඳුන්වන හේවුඩ් එස්ටේට් නමැති ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 0.8518 ක් වූ විශාලත්වයෙන් යුත් රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : මූලික පිඹුර මා 715 හි කැබලි අංක 36, 37 සහ 49 ;

*නැගෙනහිරට* : මූලික පිඹුර මා 715 හි කැබලි අංක 57, 58, 59, 61, 60 සහ වත්තේ සිට වත්ත දක්වා වූ මාර්ගය ;

*දකුණට* : බුලන්වත්ත ඔය, අඩිපාර, මූලික පිඹුර මා 715 හි කැබලි අංක 62, 56, 62, බුලන්වත්ත ඔය සහ මූලික පිඹුර මා 715 හි කැබලි අංක 53 ;

*බටහිරට* : මූලික පිඹුර මා 715 හි කැබලි අංක 55, 52, 51, 50, 44, 43, හිමිකම් පිඹුර 43535, බුලන්වත්ත ඔය සහ හිමිකම් පිඹුර 43535.

*ප්‍රමාණය* : හෙක්. 0.8518.

**උපලේඛනය 04**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉඹුල්පිටිය ගමේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මූලික පිඹුර මා 1414 හි කැබලි අංක 1 ලෙස හඳුන්වන හල්ගොල්ලේ මූකලාන නමැති ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 1.0350 ක් වූ විශාලත්වයෙන් යුත් රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : හල්ගොල්ලේ ඇළ ;

*නැගෙනහිරට* : වත්තේගම සිට ඇල්කඩුව දක්වා වූ මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ගය ;

*දකුණට* : මූලික පිඹුර ඒ 508 හි කැබලි අංක 3, පි. ආර්. එම්. එච්. පුංචිබණ්ඩා හිමිකම් කියන හල්ගොල්ලේ වත්ත, මූලික පිඹුර ඒ 508 හි කැබලි අංක 2 සහ ටී. එම්. ටී. හීන්බණ්ඩා හිමිකම් කියන හල්ගොල්ලේ වත්ත ;

*බටහිරට* : ටී. එම්. ටී. හීන්බණ්ඩා හිමිකම් කියන හල්ගොල්ලේ වත්ත, මූලික පිඹුර ඒ 508 හි කබලි අංක 2 සහ හල්ගොල්ලේ ඇළ.

*ප්‍රමාණය* : හෙක්. 1.0350.

**උපලේඛනය 05**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රත්වත්ත ගමේ සර්වේ ජනරාල් විසින් සම්පාදිත මූලික පිඹුර මා 1415 හි කැබලි අංක 1 ලෙස හඳුන්වන පුහුඅරඹ නමැති ඉඩමේ බිම් ප්‍රමාණය හෙක්ටයාර් 9.6560 ක් වූ විශාලත්වයෙන් යුතු රජයේ ඉඩම් ප්‍රදේශය වේ.

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන කඩුවෙල එස්ටේට්, ජල මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන කඩුවෙල එස්ටේට්, රයිතලාවෙල සිට වැහිගල දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන කඩුවෙල එස්ටේට්, රත්වත්ත ගම, උඩවැහිගල ගම, මූලික පිඹුර මා 18 හි කැබලි අංක 01 හා ජල මාර්ගය ;

*නැගෙනහිරට* : ජල මාර්ගය, උඩවැහිගල ගම හා පහළවැහිගල ගම, මූලික පිඹුර මා 18 හි කැබලි අංක 01, පහළවැහිගල ගම, මූලික පිඹුර මා 18 හි කැබලි අංක 4 සහ 3 ;

*දකුණට* : මූලික පිඹුර මා 18 හි කැබලි අංක 03, කේ. කළුවා හිමිකම් කියන කුඹුරේගෙදරවත්ත, ඇළ, කේ. හොරතලී සහ තවත් අය හිමිකම් කියන කුඹුරේගෙදරවත්ත, මූලික පිඹුර මා 18 හි කැබලි අංක 5, 1, රයිතලාවෙල සිට වැහිගල දක්වා වූ ප්‍රාදේශීය සභා මාර්ගය, මූලික පිඹුර මා 18 හි කැබලි අංක 7 (කපන ලද කාණුව), 8, පුහුඅරඹේ ඇළ, දිඹුල්ගොඩ ගම සහ නියරේපොල ගම ;

*බටහිරට* : නියරේපොල ගම, පුහුඅරඹේ ඇළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන කඩුවෙල එස්ටේට් සහ ඩේවිඩ්සන් පුද්ගලික සමාගම හිමිකම් කියන කඩුවෙල එස්ටේට්.

*ප්‍රමාණය* : හෙක්. 9.6560.

03 - 477

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.